# සුදු පූසා



එල්.ඒ. සඳලි සම්මානි

# සුදු පූසා

එල්.ඒ. සඳලි සම්මානි

# සුදු පූසා

ප්‍රථම මුද්‍රණය : 2023 ඔක්තෝබර්

කතාව සහ චිත්‍ර : **එල්.ඒ.සඳලි සම්මානි**
2 ශ්‍රේණිය D
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

ISBN : 978-624-206-884-8

# පිදුම

ජීවිතය ජය ගන්න පුංචි මට

අත්වැලක් වන

මාගේ ආදරණීය ගුරු මෑණියන් වූ

ප්‍රමිතා වෙත්තසිංහ ගුරුතුමියට

මෙම පොත පුද කරමි.....!

# ස්තූතිය

E Book ව්‍යාපෘතිය සඳහා පෙරමුණ ගත් ගරු විදුහල්පතිතුමිය, නියෝජ්‍ය විදුහල්පති තුමිය, ප්‍රාථමික අංශයේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය, අනෙකුත් ගුරු මෑණිවරු, පියවරු සහ 2 ශ්‍රේණිය D පන්තියේ මගේ පන්තිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුතුමියට ද, මාගේ ආදරණීය ස්තූතිය පුද කරමි.

තවද, මෙම පොත සකස් කිරීමට උපදෙස් දුන් හා උපකාර කළ මාගේ මවටත්, පියාටත් ස්තූතිය පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයිග  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.  එම ජාතික අරමුණ මෙන්ම පාසල් දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කර ගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යයතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමි "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

ඒකෝමත් එක කාලෙක පූස් පවුලක් පුංචි ගෙදරක වාසය කළා. ඒ පවුලේ හිටියේ පූස් අම්මා, පූස් තාත්තා, පූස් ආච්චි, පූස් සීයා, පූස් පුතා සහ පූස් දුව යි. පූස් පුතා හරිම අකීකරුයි. අම්මා, තාත්තා කියන දේ පොඩ්ඩක්වත් අහන්නේ නෑ. දවසක් මේ පූස් පුතා මිදුලේ දුව දුව හිටියා. පූස් පුතා වැටුණා. එයා ඇඬුවා. අම්මා මෙහෙම කිවුවා.



"පුතේ ඔයා මින් පස්සේ කියන දේ අහන්න එතකොට ඔයාට මෙහෙම වෙන්නේ නෑ". ඒත් මේ පූස් පැටියා කියන දේ ඇහුවේ නෑ. තවත් දවසක මේ පූස් පැටියා තනියම කැලේට ගියා. එතකොට කොටියෙක් මෙයාව අල්ල ගන්න ගියා. මේ පූස් පැටියා ඈතට වේගයෙන් දුවගෙන ගියා. මේ අතරේ කොටියාත් එයා පිටුපසින් තවත් වේගයෙන් දුවගෙන ඇවිත් පූස් පැටියාව අල්ලා ගත්තා.



ඊට පස්සේ පූස් පැටියා කොටියාගෙන් බේරෙන්න දැඟලුවා."අනේ දෙවියනේ මං අම්මා කියන දේ ඇහුවා නම් මට මෙහෙම වෙන්නේ නෑනේ" පූස් පැටියා එහෙම කිය කියා අඬමින් කඳුළු පිහන්න අත් දෙක උඩට ඉස්සුවා. එතකොට එයාගේ අත් දෙක කොටියාගේ නහයේ වැදුණා.



එතකොට කොටියට කිවිසුමක් ගියා. ඒත් එක්කම පූස් පැටියා අත හැරුණා. එවිට පූස් පැටියා වේගයෙන් ඉස්සරහට දිවුවා. ඉන් පසු කොටියත් එයා පිටුපස එලෙවුවා. එයා පණ බේරා ගන්න ගසක් උඩට නැග්ගා.



එතකොට කොටියත් ගහ උඩට නැග්ගා. පූස් පැටියා බිමට නැමුණු අත්තක් දිගේ බාගෙට බැහැලා ගසේ කඳට පැන්නා. ඊට පස්සේ පූස් පැටියා ඉතිරි ටික ගසේ කඳ දිගේ බිමට බැහැගෙන ආවා. එවිට කොටියා ගහ උඩ තනි වුණා.





මේ අතරේ පූස් පැටියා ඉස්සරහට දිවුවා. කොටියත් පූස් පැටියා පසු පසින් එලවන්න පටන් ගත්තා. දැන් නම් පූස් පැටියාට හරිම මහන්සි යි. පූස් පැටියා ගස යටට වෙලා හිටියා. එවිට කොටියා එන ශබ්දය ඇසුණු නිසා පූස් පැටියා වේගයෙන් දිවුවා. කොටියාත් තමන්ගේ වේගය තවත් වැඩි කළා.



මෙහෙම දුවගෙන යන අතරේ පූස් පැටියා පාර මැද තිබුණු ගස් දෙබලක් අතරෙන් පැන්නා. පූස් පැටියා පස්සෙන් පන්නගෙන ආපු කොටියත් ගස් දෙබලෙන් පනින්න ගියා. එහෙම පනින්න ගිය කොටියා ගස් දෙබලේ හිර වුණා.

කොටියගේ ශබ්දයක් නැති නිසා පසු පස හැරීලා බලපු පූස් පැටියා කොටියා ගස් දෙබලේ හිර වෙලා ඉන්නවා දැක්කා. ඊට පස්සේ පූස් පැටියා ගෙදර හොයාගෙන ගියා. එයා ගෙදරට යනකොට ගෙදර හැමෝම එයා නැතිව දුකින් අඬ අඬා ඉන්නවා දැක්කා. පූස් පැටියාව දැක්ක පූස් අම්මා පූස් පැටියා ළඟට දුවගෙන ආවා.



පූස් පැටියත් අම්මා ළඟට දුවගෙන ගිහින් අම්මාව බදාගෙන ඇඬුවා. "ආයේ නම් මම කවදාවත් අම්මා තාත්තා කියන දේ අහන්නේ නැතිව ඉන්නේ නෑ". අද ඉඳන් මම අම්මලාට කීකරු හොඳ පුතෙක් වෙනවා." පූස් පැටියා අම්මාට පොරොන්දු වුණා.

# නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථීක පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත්කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනය කරණ කැඩපතකි, මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසු වෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ
ව්‍යාපෘතියේ නිර්මාතා.

ISBN : 978-624-206-884-8

